# ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සැලසිය යුතුයි.....

2016 ජනවාරි මස 2 වැනිදා සෙනසුරාදා

ලංකාදීප

## ඉන්දු-ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණ සහයෝගීතා ගිවිසුම මේ වසරේ

## ඇමැති මලික් නිවේදනයකින් කියයි

ඉන්දු ලංකා ගිවිසුමට අත්සන් කරන බව දැක්වෙන ප්‍රකාශය

(අංජුල මහික වීරරත්න)

"ඉන්දු-ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණ සහයෝගීතා ගිවිසුම මේ වසරේ මැද භාගයේදී අත්සන් කරන බව සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍ය මලික් සමරවික්‍රම මහතා විශේෂ නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශකර සිටී.

නවදිල්ලියේ පැවැති සාකච්ඡාවලට අදාළව සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය නිකුත් කළ නිවේදනයේ මෙසේ සඳහන්ය.

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර 4 වැනි වාණිජ ලේකම් මට්ටමේ සාකච්ඡාව නවදිල්ලියේදී පවත්වන ලදී. මෙවර සාකච්ඡාවේ මූලික අභිප්‍රාය වූයේ පවත්නා ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම මීළඟ අදියරේදී වඩාත් පුළුල් සහයෝගිතා ක්ෂේත්‍රයක් ආවරණය වන පරිදි ඉන්දු-ශ්‍රී ලංකා ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම ලෙසට පරිවර්තනය කර ගැනීමය.

යෝජිත සහයෝගිතා රාමුව තුළ ශ්‍රී ලංකාව විසින් වෘත්තීමය ශ්‍රම නිදහස්කරණය නැව් තැනීමේ හා තොරතුරු තාක්ෂණ යන වෘත්තීන් දෙකට පමණක් සීමා කිරීමට බලාපොරොත්තුවේ. එසේම ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට වඩා හොඳින් ඉන්දීය වෙළෙඳ පොළට අවතීර්ණ වීමට අවස්ථා ගැනීම අවධාරණය කරන ලද අතර දැනට දේශීය අපනයනකරුවන් ඉන්දීය වෙළෙඳපොළ තුළ මුහුණ දෙන ගැටලු ගණනාවක් ගෙනහැර දක්වන ලදී.

ඒ අනුව ඉන්දීය පාර්ශ්ව විසින් ඉන්දු-ශ්‍රී ලංකා ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම අරභයා දෙරට අතර කරන සාකච්ඡාවලට සමගාමීව ගැටලුවලට විසඳුම්දීමට කටයුතු කරනු ඇත. ඒ අතරම වෙළෙඳ භාණ්ඩවල ප්‍රමිතීන් සම්බන්ධයෙන් අන්‍යොන්‍ය තත්ත්ව සහතික පිළිගැනීමේ ගිවිසුම් අත්සන් කිරීමටද එකඟතාව පළ කරන ලදී.

තවද 2016 ජනවාරි-පෙබරවාරි මාසවල දී ඉන්දීය ප්‍රමිතීන්, රෙගුලාසි, ව්‍යුත්පත්ති සහතික ගැනීම ආදී දැ සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩමුළු දේශීය අපනයනකරුවන් හා නිලධාරීන් උදෙසා ඉන්දීය රජයේ අනුග්‍රහය යටතේ ශ්‍රී ලංකාවේ දී පැවැත්වීමටද තීරණය කරන ලදී.

දෙරටම, යෝජිත ගිවිසුමට අදාළ ගිවිසුම් රාමුව 2016 පෙබරවාරි මස දී අත්සන් කිරීමටත්, 2016 මැද භාගයේ දී ඉන්දු-ශ්‍රී ලංකා ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම අත්සන් කිරීමටත් කටයුතු කිරීමට එකඟවන ලදී.

ඉන්දියාව ශ්‍රී ලංකාවේ ප්‍රධානතම හා සමබර වෙළෙඳ හවුල්කරුවා වේ. 2014 වර්ෂයේදී දෙරට අතර සමස්ත වෙළඳාම රුපියල් බිලියන 4.5ක් ඉක්මවා ඇත. එසේම ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ආනයනකරුවා මෙන්ම තුන්වැනි විශාලතම අපනයනකරුවා වන්නේද ඉන්දියාවය. එමෙන්ම ශ්‍රී ලංකාවේ පස්වැනි විශාලතම ආයෝජකයා ඉන්දියාව වන්නා සේම ලංකාවේ විදේශීය සෘජු ආයෝජන විශාල ප්‍රමාණයක් ඉන්දියාවේ කේන්ද්‍රගතව ඇත.

දෙරටේ ආර්ථිකයන්හි පවත්නා ප්‍රමාණාත්මක අසමමිතිකතාව පිළිබඳවද සැලකිලිමත් වෙමින් ඉන්දියාව වැනි සුවිසල් වෙළෙඳ සහකරුවකු සමග නෛතික පදනමකින් යුක්තව වෙළෙඳ කටයුතු පුළුල් කර ගැනීමට යෝජිත ඉන්දු-ශ්‍රී ලංකා ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම හරහා හැකියාව [illegible] ඇත.

## ගිවිසුමට අදාල වේ යැයි සැලකෙන ක්ෂේත්‍ර

**Services Schedules under the proposed Comprehensive Framework Economic Cooperation between Sri Lanka and India**

**Sri Lanka's Offer List**

1. Computer related Services
2. Other Business Services
   (a) Convention Services
3. Telecommunication Services
4. Financial Services
   (a) Insurance Services
   (b) Banking Services
5. Health and Social Services
6. Tourism and Travel related Services
7. Transport Services
   (a) Maritime Transport Services
   (b) Maritime Auxiliary Services

**India's Offer List**

1. Professional Services
   (a) Accounting & Book Keeping Services
   (b) Architectural Services
   (c) Engineering Services
   (d) Integrated Engineering Services
   (e) Urban Planning and Landscape Architectural Services
   ★→(f) Medical and Dental Services
   (g) Veterinary Services
   ★→(h) Services provided by midwives, nurses, physiotherapists and par-medical personnel
2. Computer related Services
3. Research and Development Services
   (a) Research and Development Services on natural sciences
   (b) Research and Development Services on social sciences
4. Real Estate Services
5. Rental/Leasing Services
6. Other business Services
   (a) Management Consulting Services
   (b) Technical Testing and Analysis Services
   (c) Services incidental to Fishing
   (d) Maintenance and Repair of Equipment (not including maritime vessels, aircraft or other transport equipments)
   (e) Packaging Services
   (f) Convention Services
7. Telecommunication Services
8. Audiovisual Services
9. Construction and Related Engineering Services
10. Distribution Services (excluding live animals)
    (a) Commission Agents' Services covering sales on a fee or contract basis
    (b) Wholesale Trade Services
11. Educational Services
12. Environmental Services
13. Health and Social Services
14. Tourism and Travel related Services
15. Recreational, Cultural and Sporting Services
16. Transport Services (a) Maritime Transport Services (b) Maritime Auxiliary Services

**ජනාධිපතිතුමා වෙත යැවුනු ලිපිය**

GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

GMOA/President/2016/0001
2016/01/04

අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා.
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය,
ජනාධිපති ලේකම් කාර්යාලය, කොළඹ 01.

අතිගරු ජනාධිපතිතුමණි,

**ජාත්‍යන්තර වෙළඳාම හා වෙළඳ ගිවිසුම් පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවය**

ඉන්දු ලංකා වෙළඳ හෝ සහයෝගිතා ගිවිසුමක් මේ වර්ෂය තුලදී අත්සන් කරන බව රජය ප්‍රකාශ කර ඇත.

වෙළඳ ගිවිසුම් තුලින් රටේ අනන්‍යතාවයටත්, පුරවැසියන්ගේ සුරක්ෂිතභාවයටත් හානියක් නොවන අයුරින් එය සැකසිය යුතුය. එපමණක් නොව ඒ තුලින් රටට සහ රට වැසියන්ට අන්‍යෝන්‍ය වශයෙන් වාසියක් සැලසිය යුතුය. දැනට පවතින ඉන්දු ලංකා භාණ්ඩ ගිවිසුමෙන් ලංකාවට වාසියක් අත් වී නැත. එම ගිවිසුමට උපදේශනය ලබාදුන් පිරිස සහ එය සැකසූ අය එහි වගකීම භාර ගන්නා බවක්ද පෙනෙන්නට නැත. එහි පාඩුව රටේ පුරවැසියන් විඳ දරා ගත යුතුව ඇත. හෙයින් ගිවිසුමෙන්ද මේ අයුරින්ම සිදුවූ විශාල අලාභය පරම්පරා ගණනක් අප ගෙවිය යුතුය.

මෙවැනි ද්විපාර්ශවික ගිවිසුම් ලංකාවේ අධිකරණය අභිබවා යයි. ගිවිසුමක ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමකට ඇති ක්‍රමවේදය බේරුම්කරණයයි. එය තාක්ෂණික හා නීතිමය වශයෙන් ශ්‍රී ලංකාව වැනි රටකට ඉතා සංකීර්ණ හා අපහසු කටයුත්තක් වන අතර අති මහත් මුදල් සම්භාරයක් වැය වන කටයුත්තකි. එය ශ්‍රී ලංකාව වැනි රටකට ඔරොත්තු නොදෙන තරමේ කටයුත්තක් බව හෙපින් ගිවිසුම බේරුම්කරණයේදී මනාව පැහැදිලි විය.

මේ වසරේ අත්සන් කරන බව පවසන ඉන්දු ලංකා ගිවිසුම උපදේශනය කරන පිරිසත්, එය සකස් කරන පිරිසත්, එහි පාරදෘෂ්‍යභාවය රකින බවක් පෙනෙන්නට නැත. කෙසේ නමුත් ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමා යම් තොරතුරු ප්‍රමාණයක් අප වෙත ලබා දීමට ගත් උත්සාහය අපි අගය කරමු. නමුත් මේ ගිවිසුම තුලින් අපේ රටට සිදුවේ යැයි පවසන වාසිය ගැන අප සාමාජිකත්වය පැහැදී නැත. ඇත්ත වශයෙන්ම මෙම ගිවිසුම තුලින් දැනට අවාසි සහගත තත්ත්වයක් පවතින ඉන්දු ලංකා භාණ්ඩ ගිවිසුමට වඩා විශාල හානියක් වනු ඇතැයි ඔවුන්ගේ මතය වී ඇත.

එබැවින් **ජාත්‍යන්තර වෙළඳාම හා වෙළඳ ගිවිසුම් සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සැකසීම කළ යුතු බවත්, එතෙක් ඉන්දු ලංකා වෙළඳ ගිවිසුම අත්සන් නොකල යුතු බවත්** අපි යෝජනා කරමු. ඒ තුලින් සැකයට සහ නොසන්සුන්තාවයට ලක්ව ඇති බොහෝ කාරණා විශ්ලේෂණයකට ලක් වනු ඇත.

අත්තනෝමතික තීරණ වලට වඩා ප්‍රතිපත්ති ගරුක තීරණ වලට හිස නවන රාජ්‍යයක් බිහි කිරීමට නායකත්වය දුන් ඔබතුමාගෙන්, අපගේ මෙම යෝජනාව ක්‍රියාත්මක කරන ලෙස අපි ඉතා කාරුණිකව ඉල්ලා සිටිමු.

ස්තූතියි,

වෛද්‍ය අනුරුද්ධ පාදෙනිය
සභාපති

වෛද්‍ය නලින්ද හේරත්
ලේකම්

රජය ක්ෂේත්‍ර ගණනාවක් වෙළඳාමට ලක් කරන බව පසු පිටේ ඇති දත්ත අනුව දක්වා ඇත. රටවල් අතර කෙරෙන වෙළඳ ගිවිසුම් සම්බන්ධව මිට පෙර අප දැන්විම් පත්‍රිකාවකින් ඔබ දැනුවත් කලෙමු. එම පත්‍රිකා gmoa.lk වෙබ් අඩවියේ ඇත.

ශ්‍රී ලංකාව, මෙම ක්ෂේත්‍ර වල **වෙළඳාම කල යුතුමද යන්න තිරණය කල යුතුයි.** එසේ වෙළඳාම් කරන්නේ නම් වෙළඳාම කිරීමේදී අප අනන්‍යතාවයත්, රටේ හා රට වැසියන්ගේ සුරක්ෂිතභාවයටත්, කෙටි කාලිනව හෝ දිර්ඝ කාලිනව හානියක් අත් නොවිය යුතුය. එමෙන්ම අන්‍යෝන්‍ය වාසියකටද හිමිකම් කිව යුතුය. එසේ නොවී ගිවිසුම් අත්සන් කල විට ජාතික ආරක්ෂාවටත්, අප රටේ පුරවැසියන්ගේ අයිතිවාසිකම් වලටත්, රටේ ආර්ථික සාමාජික හා සංස්කෘතික අංශ වලටත් ඇති බලපෑම **අත්සන් කිරීමට පලමුව විභාග කළ යුතුය.** මෙලෙස විභාග කිරීමකින් තොරව මිට පෙර අත්සන් තබන ලද ගිවිසුම් නිසා අප රටට අත් වි ඇති අගතිය ඔබ දන්නවා ඇත. මෙම ගිවිසුම් වල විපාක වලට **වන්දි ගෙවන්නේ අපි හා අනාගත පරම්පරාවයි.**

අප රට ආරක්ෂා කර ගැනිම සඳහා **"ජාත්‍යන්තර ගිවිසුම් වෙළඳාම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක්"** බිහිකල යුතුය. අන් රටවල් වල මෙවන් ජාතික ප්‍රතිපත්තියක් ඇත. ඉන්දියාවේද එවන් ප්‍රතිපත්තියක් ඇත. එම රටවල් ගිවිසුම අත්සන් කිරීමට පළමුව එහි බලපෑම පිළිබඳ **විද්වතුන් යොදවා විද්‍යාත්මක විශ්ලේෂණයක්** සිදු කරයි. ඒ තුලින් වෙළඳාම කල යුතු ක්ෂේත්‍රය තෝරා ගැනිම පමණක් නොව: **කල යුතු ක්‍රමවේදය**, **තිබිය යුතු සීමාවන්** හා බේරුම්කරණය වැනි කරුණු ඉතා ගැඹුරෙන් සලකා බැලේ. අප මෙහි ඇති ලිපියෙන් ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ ජාත්‍යන්තර ගිවිසුම් සම්බන්ධව අප රට ගත යුතු නිවැරදි ක්‍රමවේදය ස්ථාපනය කරන ලෙසයි.